කොටස් හිමියෙකු හෝ ණය හිමියෙකු හෝ සමාගම විසින් බැඳීමක් දරන කෙනෙකු හට මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ඉල්ලීමක් මත නොමිලේ ලබා ගත හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මෙට්‍රොපොලිටන් කොම්ප්‍යුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,

ලසන්ති අබේකෝන්,
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
ලේකම්වරුන්.

2021 ජූලි මස 16 වැනි දින.

08-21

## ප්‍රසිද්ධ නිවේදනය

මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී
(පීවී 9395)

**මෙට්‍රොපොලිටන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (පීවී 16193) සහ මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී සමාගම (පීවී 9395) අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය යටතේ සිදු කෙරෙන යෝජිත ඒකාබද්ධ කිරීම පිළිබඳව එම පනතේ 242(3) (ආ) වගන්තියට යටත් ප්‍රසිද්ධ නිවේදනයයි**

මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී සහ මෙට්‍රොපොලිටන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල විසින් 2021 ජූලි මස 16 වැනි දින සම්මත කර ගන්නා ලද යෝජනාවලට ප්‍රකාරව, ඉහත සමාගම් දෙක, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වන වගන්තියට අනුව ඒකාබද්ධ කිරීමෙන්, මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී ඒකාබද්ධිත සමාගම ලෙස පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලවල අනුමැතිය ලැබී ඇත.

ඉහත සමාගම් විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඒකාබද්ධ කිරීමේ යෝජනාව සහ ඉහත සඳහන් පනතේ 243 වගන්තියට අදාළ ලේඛන ඉදිරිපත් කළ පසු, මෙම දැන්වීම නිකුත් වී දින 20ක් ගතවීමෙන් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඉහත සඳහන් පනතේ 244 (2) වගන්තිය යටතේ නිකුත් කෙරෙන ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් වීමෙන්, මෙම ඒකාබද්ධ කිරීම බලාත්මක වේ.

ඉහත දක්වා ඇති පනතේ 242 (4) වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩල විසින් ඒකාබද්ධ කිරීම සම්මත කර ගන්නා ලද යෝජනා එක්ව ගත් කළ, අනුමත කරන ලද ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් ඉන් සජ්ජිත වන්නේ යැයි දැක්වේ. එහෙයින් කොටස් හිමියකුට හෝ ණය හිමියෙකුට හෝ සමාගම විසින් බැඳීමක් දරන කෙනෙකුට ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් අංක 85, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02 යන ලියාපදිංචි කාර්යාලයේ දී සාමාන්‍ය ව්‍යාපාර කටයුතු පවත්වන වේලාවන්හි දී පරීක්ෂා කළ හැක.

කොටස් හිමියෙකු හෝ ණය හිමියෙකු හෝ සමාගම විසින් බැඳීමක් දරන කෙනෙකු හට මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ඉල්ලීමක් මත නොමිලේ ලබා ගත හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී,

ලසන්ති අබේකෝන්,
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
ලේකම්වරුන්.

2021 ජූලි මස 16 වැනි දින.

08-22

**ප්‍රසිද්ධ නිවේදනය**

මෙට්‍රොපොලිටන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (පීවී 16193)

**මෙට්‍රොපොලිටන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (පීවී 16193) සහ මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී සමාගම (පීවී 9395) අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය යටතේ සිදු කෙරෙන යෝජිත ඒකාබද්ධ කිරීම පිළිබඳව එම පනතේ 242(3) (ආ) වගන්තියට යටත් ප්‍රසිද්ධ නිවේදනයයි**

මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී සහ මෙට්‍රොපොලිටන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල විසින් 2021 ජූලි මස 16 වැනි දින සම්මත කරන ගන්නා ලද යෝජනාවලට ප්‍රකාරව, ඉහත සමාගම් දෙක, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වන වගන්තියට අනුව ඒකාබද්ධ කිරීමෙන්, මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී ඒකාබද්ධිත සමාගම ලෙස පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලවල අනුමැතිය ලැබී ඇත.

ඉහත සමාගම් විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඒකාබද්ධ කිරීමේ යෝජනාව සහ ඉහත සඳහන් පනතේ 243 වගන්තියට අදළ ලේඛන ඉදිරිපත් කළ පසු, මෙම දැන්වීම නිකුත් වී දින 20ක් ගතවීමෙන් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඉහත සඳහන් පනතේ 244 (2) වගන්තිය යටතේ නිකුත් කෙරෙන ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් වීමෙන්, මෙම ඒකාබද්ධ කිරීම බලාත්මක වේ.

ඉහත දක්වා ඇති පනතේ 242 (4) වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩල විසින් ඒකාබද්ධ කිරීම සම්මත කර ගන්නා ලද යෝජනා එක්ව ගත් කළ, අනුමත කරන ලද ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් ඉන් සජ්ජිත වන්නේ යැයි දක්වේ. එහෙයින් කොටස් හිමියකුට හෝ ණය හිමියෙකුට හෝ සමාගම විසින් බැඳීමක් දරන කෙනෙකුට ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් අංක 85, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02 යන ලියාපදිංචි කාර්යාලයේ දී සාමාන්‍ය ව්‍යාපාර කටයුතු පවත්වන වේලාවන්හි දී පරීක්ෂා කළ හැක.

කොටස් හිමියෙකු හෝ ණය හිමියෙකු හෝ සමාගම විසින් බැඳීමක් දරන කෙනෙකු හට මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ඉල්ලීමක් මත නොමිලේ ලබා ගත හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මෙට්‍රොපොලිටන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්,

ලසන්ති අබේකෝන්,
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
ලේකම්වරුන්.

2021 ජූලි මස 16 වැනි දින.

08-23

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබැරුම් රේන්ද විකිණීම - වර්ෂ 2022

1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබැරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපානු ලබන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2022 වර්ෂය තුළ විදේශ මත්පැන් තැබැරුම් රේන්ද සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන වන, මා විසින් 2021.08.13 වැනි දින පෙ. ව. 10.30 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයකින් සමන්විත විය යුතු අතර,

(අ) ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක්, සහ

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිළිබඳ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

" ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු යඃ-

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක්, හා
*(ආ)* වත්කම් සහතිකයක් සමග,

ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ තැබෑරුම් අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කර "වරප්‍රසාදය මිල දී ගත් තැනැත්තා"යැයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුව විසින් ''ගෙවීම් සඳහා'' ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද 2021.09.13 වැනි දින පෙරවරු 10.30ට නැවත විකිණීම සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත- ගම්පොල.

2020 ජූලි මස 01 වැනි දින,
ගම්පොල- උඩපළාත
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*2022 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව*

| *අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත.* |
|---|---|---|---|---|---|
| 01. පුස්සැල්ලාව විදේශ මත්පැන් තැබෑරුම | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2021.08.13 වැනි දින පෙ. ව. 10.30 | 3,000.00 |

08-69/2

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - මැදවච්චිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ මැදවච්චිය පදිංචි චමින්ද ලොකුසූරිය සහ සමිතා සුභාශිනී මීපේ මොහොට්ටි යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ, මැදවච්චිය ප්‍රාදේශීය සභා සීමාව තුළ නුවරගම්පළාත, කඩවත් කෝරළේ, මැදවච්චිය ගමේ පිහිටි එෆ්. වී. පී. 113 හි (වීපී 418952) ලොට් 1 පී හි කොටසක් ද වන බලයලත් මිනින්දෝරු වී. සිවරත්නම් විසින් සාදන ලද 1953.07.04 දිනැති අංක 1296 සැලැස්මේ සඳහන් ලොට් 3 හි කොටසක් ද වන බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 1993.06.24 දිනැති අංක 2344 දරන සැලැස්මේ සඳහන් ලොට්ස් 19 සහ 20 හි කොටසක් සහ ලොට්ස් 17, 18 ද වන බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 2006.02.02 දිනැති අංක 4604 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 සහ බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සකසන ලද 2005.07.21 දිනැති අංක 4505 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 හි නැවත මැනීමක් සහ එකතු කිරීමක් වන එන්. බී. ඒකනායක විසින් සාදන ලද 2013.03.22 දිනැති අංක 1212 දරන සැලැස්මේ සඳහන් මැදවච්චිය කැලේ නමැති ඉඩමේ ලොට් 1 ලෙස ලකුණු කළ පර්චස් තිස් පහයි දශම එකයි එකක් (අ. 0, රූ. 0, පර්. 35.11) නොහොත් හෙක්ටයාර් 0.0888ක් විශාල එහි පිහිටි වෙනත් සියලුම දේ සමඟ ඉඩම.

ඉහත සඳහන් කළ දේපළ 2021 අගෝස්තු මස 31 වැනි දින පස්වරු 2.30 ට සෙලාන් බැංකුව පීඑල්සී මැදවච්චිය ශාඛා පරිශ්‍රයේ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

*දේපළට පිවිසීම.*- මැදවච්චිය ඔරලෝසු කණුව මංසන්ධියේ සිට යාපනය මාර්ගය ඔස්සේ මීටර් 300 ක පමණ දුරක් ඉදිරියට ගොස් දකුණ පසට ඇති බොරළු පාරට හැරී තවත් මීටර් 100 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස් සහ නීති රීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

"*යෝජනා සම්මුති දැන්වීම.-* රජයේ ගැසට් පත්‍රයේ 2019.03.29 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ තිනකුරල් යන පුවත්පත්වල 2019.03.14 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :* සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකතන අංක : 011 - 2456479, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011 - 3068185, 011- 2572940.

08-43

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ඩෙවලප්මන්ට් බැන්කිං යුනිට්**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ සහ යන්ත්‍ර සූත්‍ර බත්තරමුල්ල, සංස්ථාගත කිරීමේ සහතික අංක (එන්පීවීඑස්) 34674 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන සකුරා ඩෙන්ටල් හොස්පිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදයි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

*1 වන වෙන්දේසියේ විකිණීම :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ බත්තරමුල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් සාදන ලද 2003.10.22 දිනැති අංක 1571 දරන සැලැස්මේ සඳහන් බත්තරමුල්ල පාර වරිපනම් අංක 172 දරන නුගගහකුඹුර හෙවත් මීගහකුඹුර නමැති ඉඩමේ ලොට් 1 ඒ ලකුණු කල බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1571 දරන සැලැස්ම අනුව පර්චස් තිස් නවයයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 39.35) විශාල, ගොඩනැගිලි, ගස් සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඡී 1451/208 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 1 ඒ පහත සඳහන් ඉඩම්වල එකතුවකි.

1. පෙරකී බත්තරමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් සාදන ලද 2003.06.24 දිනැති අංක 1487 දරන සැලැස්මේ සඳහන් නුගගහකුඹුර හෙවත් මීගහකුඹුර නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙද වෙන්කරන ලද ඉඩම කොටස එකී අංක 1487 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් දෙකක් විශාල (අ. 0, රූ. 1, පර්. 2) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

2. පෙර කී බත්තරමුල්ල පිහිටි පෙර කී අංක 1487 දරන සැලැස්මේ සඳහන් නුගගහකුඹුර හෙවත් මීගහකුඹුර නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1487 දරන සැලැස්ම අනුව පර්චස් අටයි දශම තුනයි පහක් (අ. 0,

රූ. 0, පර්. 8.35) විශාල, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2021 අගෝස්තු මස 26 වැනි දින පෙරවරු 10.00 ට සෙලාන් බැංකුව පීඑල්සී ඩෙවලප්මන්ට් බැන්ක් යුනිට් ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

*දේපලට පිවිසීම.* - කොළඹ සිට රාජගිරිය දක්වා ගිය විට ඇති ජයවර්ධනපුර මාවතට පිවිස තවත් කි. මී. 1.5ක් පමණ ගොස් කඩුවෙල පාරට පිවිස තවත් මීටර් 100ක් පමණ ඉදිරියට ගිය විට පාරේ වම්පස අදාළ දේපල පිහිටා ඇත.

*2 වන වෙන්දේසියේ විකිණීම.* -

| | *යන්ත්‍ර සූත්‍ර* | *මාදිලිය/අනුක්‍රමික අංකය* |
|---|---|---|
| 1. | වීඅයිපී චෙයාර් (පුටු) සමග ඉන්ට්‍රා ඕරල් කැමරා සහ උපාංග සමග (සිග්නෝ ජී 30) | 1320818135 |
| 2. | ඩෙන්ටල් චෙයාර්ස් (පුටු) සහ උපාංග (ඇක්ටස් 9000) | අක්ටස් ඊසී - යූ |
| 3. | හැන්ඩ් ඉන්ස්ට්‍රුමන්ට් ඩෙන්ටල් ට්‍රීට්මන්ට් සඳහා | |
| 4. | ඩෙන්ට්ල් සර්ජරි ඉන්ස්ට්‍රුමන්ට් | |
| 5. | කටිං ඉන්ට්ස්රුමන්ට් ඇන්ඩ් ඇබ්‍රේසිව්ස් | |
| 6. | අල්ට්‍රාසොනික් ක්ලීනර් | 6021 |
| 7. | ඩෙන්ට්ල් එක්ස් කිරණ ඒකකය | |
| 8. | පැනරොමික් එක්ස් කිරණ ඒකකය | |
| 9. | ඔටෝමැටික් ෆිල්ම් ප්‍රොසෙසර් | 920461 |
| 10. | ඔටෝක්ලේව් | සීඕ 421026/27 |
| 11. | ඩෙන්ටල් පෝට් රූට් ඉසෙඩ්එක්ස් | ඩීපී 2 එක්ස් - 31119 |
| 12. | ඩෙන්ටල් පෝට් ඉසෙඩ්එක්ස් | එච්ජී. 4024/25 |
| 13. | එන්ඩෝ වේව් 21 මිලිමීටර | |
| 14. | එන්ඩෝ වේව් 25 මිලිටීටර | |
| 15. | පල්ප් ටෙස්ටර් | 49831/43/45 |
| 16. | පෝසිලේන් ෆර්නාස් | ඊඑස්ජීජ්අයිඒ/156254 |
| 17. | වැකුම් පම්ප් | 34125 |
| 18. | රිං ෆර්නස් | 0410016 |
| 19. | ආෆ්ටර් බර්නර් | එස්ඒ.බී100 පැරන්හයිට් |
| 20. | සෙන්ට්‍රිපියුගල් | |
| 21. | වැකුම් මික්සර් | 7648 |
| 22. | වයිබ්රේටර් | 230 |
| 23. | මොඩ්ල් ට්‍රිමර් | 2502 |
| 24. | ලැබෝර්ටරි එයාර් ටර්බයින් | |
| 25. | ලැබෝර්ටරි මයික්‍රෝ මෝටර් | 7609/07/08 |
| 26. | ස්ටීම් ක්ලීනර් | ජේඑස් 2500 |
| 27. | එයාර් ගන් කිට් | |
| 28. | ලැබෝර්ටරි ගැස් ටෝච් වයිජී | වයිජී 9000 |
| 29. | මල්ටි පර්පස් ලයිට් කියෝරිං යුනිට් | 2376 |

| | *යන්ත්‍ර සූත්‍ර* | *මාදිලිය/අනුක්‍රමික අංකය* |
|---|---|---|
| 30. | හීට් කියෝරිං යුනිට් | 4366එස්එන්01 |
| 31. | ලැබෝටර්ටරි ලේත් | 3733 එස්එන්ඕ |
| 32. | ජේ. එම්. හයිඩ්‍රොලික් ප්ලාස්ක් ප්‍රෙස් | 1778 |
| 33. | පෙන්සිල් බ්ලාස්ටර් | එක්කේ 012 |
| 34. | සුපර් එල්ඩර් | එස්ඊ 3 |
| 35. | ලැබෝර්ටරි වැකුම් මවුත් | |
| 36. | ආර්ටිකියුලේටර් ස්පේසි ටයිප් යුනිට් | වයිපේ 370 ඩබ්ලිව් - ඩී |
| 37. | කම්ප්‍රෙෂර් | වයිපේ 260ඩබ්ලිව් - ඩී |

මේවා බත්තරමුල්ල ශ්‍රී සුභූතිපුර ගැමුණු මාවතේ අංක 16/7 සකුරා ඩෙන්ටල් හොස්පිටල් ප්‍රයිවට් ලිමිටඩ්හි බහා ඇත.

ඉහත සඳහන් යන්ත්‍ර සූත්‍ර සහ භාණ්ඩ 2021 අගෝස්තු මස 26 වැනි දින පෙරවරු 10.30 ට සෙලාන් බැංකුව පීඑල්සී ඩෙවලප්මන්ට් බැන්ක් යුනිට් ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස් සහ නීති රීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.-* රජයේ ගැසට් පත්‍රයේ 2010.03.05 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ තිනකුරල් යන පුවත්පත්වල 2001.04.09 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම් කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011 - 2456479, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව,
දුරකථන අංක 011 - 3068185, 011- 2572940.

08-44

## සෙලාන් බැංකුව පීඑල්සී - දඹුල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ දෙදෙනාම දඹුල්ල පදිංචි සේනාරත්න මුදියන්සේලාගේ රංජිත් සේනාරත්න සහ ඇස්වෙද ගෙදර කුසුමාවතී හෙවත් ඇස්වෙද ගෙදර කුසුමාවතී යන අය බන්ධනදයින්/උකස්කරුවන් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල මහ නගර සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පැල්වෙහෙර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පැල්වෙහෙර පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එම්. ආරියදාස විසින් සාදන ලද 2015 ජනවාරි මස 12 දිනැති අංක 15015 දරන සැලැස්මේ නිරූපනය වන පැල්වෙහෙර ජනපදය යනුවෙන් හඳුන්වනු ලබන සහ නැමති ඉඩමේ කොටසක් වන ලොට් 260 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසි නවයයි දශම හතක් (අ. 01, රූ. 01, පර්. 29.7) නොහොත් හෙක්ටයාර 0.5810 ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

#### රජයේ ප්‍රදානයේ ප්‍රකාශිත කොන්දේසි සහ සීමාවන්

1. සීමාවන් :

දේපල තුළ නොහොත් දේපලෙහි ඇති සියලු ඛනිජ වස්තුවලට ඇති හිමිකම (මෙම ප්‍රදානයේ ඇති මෙම යෙදුමට සුවිශේෂ ගල් ඇතුළත් වේ) සහ කැනීම, සෙවීම, වැඩ කර සහ යම්කිසි ඛනිජ වස්තුවක් බැහැරව ගෙන යාම රජයට සීමාවේ.

2. දේපළ අයිතිකරුගේ හිමිකම යම්කිසි මාර්ග අයිතියකට නොහොත් මෙම ප්‍රදානයේ දිනට දේපල මත පවත්නා වෙනත් පරවශතාවන්ට යටත් වේ.

*කොන්දේසි:*

1. හිමිකරු දේපළෙහි මෙහි තුළ සඳහන් ජල සම්පාදනය කරන ලද හෙක්ටයාර 0.202 කට අඩු ප්‍රමාණයේ අතුරු බෙදූ කොටසක් නොවිකිණිය යුතුය.

2. හිමිකරු දේපළෙහි නොබෙදූ කොටස් මෙහි තුළ නියමිත අඩුම කොටසින් දෙකෙන් එකකට අඩුවෙන් නොවිකිණිය යුතුය.

3. කොන්දේසි 1හි නියමිත අතුරු බෙදූ ඒකකයට අඩු ප්‍රමාණයේ බෙදූ දේපල කොටසකට කිසිවෙකු හිමිකරුවෙකු නොවිය යුතුය.

4. කොන්දේසි 2 හි නියමිත අඩුම කොටසට අඩුවෙන් නොබෙදූ දේපළ කොටසකට කිසිවෙකු හිමිකරුවෙකු නොවිය යුතුය.

5. දේපලට හෝ එහි ජල සම්පාදනය කළ හැකි යම්කිසි කොටසක් හෝ ජල සම්පාදන ක්‍රියාවලියේ දී දැනටමත් කර ඇති යම්කිසි ජල සම්පාදන ක්‍රියාවලියකින් මින්පසු කරනු ලබන ක්‍රියාවකින් මින්පසු ජල සම්පාදනය වුවහොත්, ජල සම්පාදනය කළහැකි ප්‍රදේශය සම්බන්ධයෙන් හිමිකරු වාරි මාර්ග ආඥා පනතේ (453 පරිච්ඡේදය) ප්‍රතිපාදන සහ ඒ යටතේ සැකසුණු යම්කිසි නියෝග පිළිපැදිය යුතුවේ.

6. හිමිකරු දිසාපතිවරයාගෙන් ලිඛිත අවසරයක් සහ නියමිත බලධාරියාගෙන් බලපත්‍රයක් නොලබා ඉඩම තුළ හෝ ඉඩමෙහි කැණීම හෝ සෙවීම්, ගැනීම, නතුකර ගැනීම, විකිණීම හෝ වෙනත් අයුරු යම්කිසි සුවිශේෂී ගල් ඉවත් නොකළ යුතුය.

7. දේපළ හෝ යම්කිසි කොටසක් ප්‍රාදේශීය ලේකම් තුමාගේ පූර්ව ලිඛිත අවසරයක් නොමැතිව බැහැර නොකළ යුතුය.

ඉහත සඳහන් කළ දේපළ 2021 අගෝස්තු මස 31 වැනි දින පෙරවරු 10.30 ට සෙලාන් බැංකුව පීඑල්සී දඹුල්ල ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

*දේපළට පිවිසීම.-* දඹුල්ල සිට ත්‍රිකුණාමලය දෙසට දිවෙන මාර්ගය ඔස්සේ (හබරණ පාර) කි. මී. 3.5 ක පමණ දුරක් ගොස් (පැල් වෙහෙර ග්‍රාමය දක්වා) 94 වන කි. මී. කණුව පසු කල විගස අදළ දේපළ මාර්ගයේ වම්පසින් ප්‍රධාන මාර්ගයට මුහුණ ලා පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස් සහ නීති රීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.-* රජයේ ගැසට් පත්‍රයේ 2019.07.12 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ තිනකුරල් යන පුවත්පත්වල 2019.07.12 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම් කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම කළ යුතු ය. 1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක

මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011 - 2456479, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව,
දුරකථන අංක : 011 - 3068185, 011- 2572940.

08-45

---

**මහජන බැංකුව - ගලේවෙල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර උඩුගොඩ පල්ලේසිය පත්තුවේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ගලේවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, ලේනාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ලේනාවල ග්‍රාමයේ පිහිටි අඹගහකුඹුරේ හේන බෙදූ කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එම්. ජයසුන්දර විසින් 2013 මාර්තු මස 31 වැනි දින මැන සාදන ලද අංක 4924 දරන පිඹුරේ ලොට් අංක 04 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 01, පර්. 16

එහි පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සියල්ල සහිතව මාතලේ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක එම් 22/134 ලෙස ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.-* ගලේවෙල - මාතලේ පාරේ (මාදිපොල හරහා) කිලෝමීටර් 05ක් පමණ ගමන් කර වහකෝට්ටේ වෙත පිවිසෙන්න. එතැන් සිට කිලෝමීටර් 02ක් පමණ ගමන් කර 07 කණුව දක්වා ගොස් පන්සල පසුකර මීටර් 250ක් පමණ ගමන් කරන විට පාරේ වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2021 අගෝස්තු මස 26 වැනි බ්‍රහස්පතින්ද දින පෙ. ව. 11.00 ට මහජන බැංකුව ගලේවෙල ශාඛා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2021.06.04 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදාල සියළුම බදු,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කළමණාකරු, මහජන බැංකුව, ගලේවෙල වෙත ගෙවිය යුතු වේ. දුරකථන 066 2288 300.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදල තොරතුරු ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 129ක සේවා විශිෂ්ටත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-48

**මහජන බැංකුව - යක්කල**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, ගම්පහ නගර සභා සීමාවේ (කොළඹ පාර වරිපනම් අංක 261/65) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 232 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හෙනරත්ගොඩ ග්‍රාමයේ දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එච්. මෙරිල් බී. පෙරේරා විසින් 2008.06.09 වැනි දින මැන සාදන ලද අංක 62/2008 දරන පිඹුරේ ලොට් අංක 1 ඒ 1 දරන ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් තිස් හයක (අක්. 0, රූ. 0, පර්. 36) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පී 296/49 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2021 අගෝස්තු මස 25 වැනි බදාදා දින පෙ. ව. 11.00 ට මහජන බැංකුව, යක්කල ශාඛා පරිශ්‍රයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව ම පවත්වනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ 2017.10.20 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2018.07.20 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - කොළඹ නුවර ප්‍රධාන පාරේ හමුවන මිරිස්වත්ත හන්දියේ සිට නුවර දෙසට මීටර් 100ක් පමණ යන විට පාරේ දකුණු පසින් පිහිටා ඇති තාර දැමූ සූකිරිවත්ත පටුමග හමුවේ. එම පාරේ මීටර් 30ක් පමණ ගිය විට පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාරක්) සහ එම කොමිස් මුදලට අදාල සියලුම බදු,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,500.00ක්
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කළමණාකරු මහජන බැංකුව යක්කල ශාඛාව වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදල විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක 033 - 2222325, 033- 2225008, 033- 2231901
ෆැක්ස් අංකය : 033 2226165, 033-2226741

''ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 129 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය:*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-49

## සෙලාන් බැංකුව පීඑල්සී - අම්බලන්ගොඩ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දෙදෙනාම බටපොල පදිංචි වලවේදුරගේ රන්දිම සුදත් මධුශංක සහ ඉලේකුට්ටිගේ තාරිකා ශෙහානි ප්‍රනාන්දු යන අය බැදුම්කරුවන්/උකස්කරුවන් වශයෙන් පැහැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඩී. ප්‍රියන්ති විසින් සහතික කරන ලද 2017.09.21 දිනැති බැදුම්කර අංක 1647 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ 2021 ක් වූ සැප්තැම්බර් මස 06 වැනි දින පෙ. ව. 10.00 ට සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව අම්බලන්ගොඩ සෙලාන් බැංකුව පීඑල්සී ශාඛා පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත්කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කය තුළ කළුතර තොටමුණ උතුර කළුතර බැද්ද කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සහ නගර සභා සීමාව තුළ 730 ඒ කලපුව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ වෝඩ් අංක 01 කටුකුරුන්ද පිහිටි බලයලත් මිනින්දෝරු ලක්ෂ්මන් සේරසිංහ විසින් සාදන ලද 2017.09.12 දිනැති අංක 4267 සැලැස්මේ නිරූපනය වන ගඟබොඩපැලවත්ත නමැති ඉඩමේ බටහිර කොටසේ ලොට් සී හි වෙන්කළ ලොට් සී 4 හි ලොට් සී 4 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 02, පර්. 20) නොහොත් හෙක්ටයාර 0.2529 ක් විශාල බිම, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - කළුතර ඔරලෝසු කණුව අසල සිට ගාළු පාර ඔස්සේ 2 කි. මී. පමණ දුරින් දකුණු පසින් හමුවන පැට්‍රික් පීරිස් මාවත දක්වා පැමිණෙන්න. එතැන් සිට එම පාරෙන් මීටර් 150ක් ගිය පසු හමුවන දුම්රිය හරස් මාර්ගය දක්වා පැමිණි පසු වම් පසින් වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම්.*- 2020.04.16 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ද අයිලන්ඩ් අරුණ සහ තිනකුරල් පුවත්පතෙහි 2021.04.19 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5% ගාස්තුව රු. 2,500,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව රු. 1,000,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා අති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නීති ප්‍රධානී සෙලාන් බැංකුව පිඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03, දුරකතන අංක 011 - 2456485, 011- 2456479, 011 - 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9, අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකතන අංක : 071-4318252, 011 - 2173282.

08-172

---

## සෙලාන් බැංකුව පීඑල්සී - ෆොරින් කරන්සි බැන්කිං යුනිට්/ඩෙවලොප්මන්ට් බැන්කිං යුනිට්

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ 02 හි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ලියාපදිංචි අංක පීබී 15 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් (ලෝටස් ටවර්) ලිමිටඩ් යන අය ප්‍රසිද්ධ නොතාරිස් එල්. පී. එන්. ද සිල්වා විසින් දෙකම සහතික කරන ලද 2007 අගෝස්තු මස 27 දිනැති අංක 18, 2007 දෙසැම්බර් මස 27 දිනැති අංක 33 ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ප්‍රොක්ටර් විසින් සියල්ල සහතික කරන ලද 2008 ජනවාරි මස 29 දිනැති 263, 2008 අප්‍රේල් 04 දිනැති 277, 2008 අගෝස්තු මස 15 දිනැති 313 සහ 2008 සැප්තැම්බර් මස 24 දිනැති 326 දරන උකස් බැදුම්කර

මගින් බන්ධනදායි/උකස්කරු වශයෙන් එකී බැඳුම්කර මත සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ :

වර්ෂ 2021 ක් වූ සැප්තැම්බර් මස 07 වැනි දින පෙ. ව. 9.30 ට සෙලාන් බැංකුව පීඑල්සී මිලේනියම් ශාඛා පරිශ්‍රයේදී, මා හට පවරණ ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත්කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ කොළඹ මහ නගර සභා සීමාව තුළ (වෝඩ් අංක 37) කොල්ලුපිටිය ගාළු පාර වරිපනම් අංක 134/1 දරන බලයලත් මිනින්දෝරු එල්. ඊ. එස්. වෙන්ඩර් වෝල් විසින් සාදන ලද 1970 ජනවාරි මස 31 දිනැති අංක 236 සැලැස්මේ නිරූපනය වන ලොට් 1 ලකුණු කළ ඉඩම් කැබැල්ලක කොටස සහ ප්‍රමාණයෙන් පර්චස් තිස් එකයි දශම එකයි හයක් (අ. 0, රූ. 0, පර්. 31.16) විශාල ඉඩම.

අංක 236 සැලැස්මේ සඳහන් ලොට් 1 හි එකී කොටස දැන් බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ (වෝඩ් අංක 37) කොල්ලුපිටිය පිහිටි කොල්ලුපිටිය, ගාළු පාරේ, වරිපනම් අංක 116 සහ 134/1 දරන බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 04 දිනැති අංක 1420 ඒ සැලැස්මේ නිරූපනය වන ලොට් 1 ලකුණු කළ දේපළෙහි කොටස (පෙර කී බලයලත් මිනින්දෝරු එල්. ඊ. එස්. වෙන්ඩර් වොල් විසින් සාදන ලද 1970.01.31 දිනැති අංක 236 සැලැස්මේ නිරූපනය වන ලොට් 1 හි කොටස සහ බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2004.08.10 දිනැති අංක 1365 ඒ සැලැස්මේ නිරූපනය වන ලොට් 1 හි එකතු කිරීමක් වන) සහ ඉඩම් ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් 2යි, පර්චස් විසි හතරයි දශම දෙකයි නමයක් (අ. 1, රූ. 2, පර්. 24.29) නොහොත් හෙක්ටයාර් 0.66846 ක් විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - කොල්ලුපිටිය හන්දියේ සිට ගාළු පාර ඔස්සේ කොටුව දෙසට මීටර් 400 ක් පමණ පැමිණි පසු වම් පසට වන්නට මෙම විෂයගත දේපළ හමුවේ. මෙය අංක 134/1 (කොටසක්) වේ.

*යෝජනා සම්මුති දැන්වීම්.*- 2020.06.19 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, අරුණ, ද අයිලන්ඩ් පුවත්පත්හි 2020.06.23 වැනි දින ද, තිනක්කුරල් පුවත්පතෙහි 2020.06.24 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු යඃ

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා අති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. - නීති ප්‍රධානී සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03, දුරකතන අංක 011 - 2456485, 011- 2456479, 011 - 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9, අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකතන අංක : 071-4318252, 011 - 2173282.

08-173

---

### මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන පනතේ 29 ඩී (29 D) වගන්තිය යටතේ වන විකුණුම් නිවේදනය

**ගොඩනැගිලි සහිත වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලවත්ත දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වැල්ලවත්ත දකුණ, අංක 47 කොට්ඨාසයේ වැල්ලවත්ත පිහිටා ඇත්තාවූ ද, රාමක්‍රිෂ්ණ පාරේ වරිපනම් අංක 35 දරන සහ ''මහවැල්ලවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා ගාමිණී බී. දෙඩංවෙල විසින් සාදන ලද (2018 ජනවාරි මස 16 වැනි දින මැන සකස් කරන ලද) 2018.04.02 වැනි දින අංක 13247 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස

ලකුණු කර ඇත්තාවූ ද, උතුරට ፡රාමක්‍රිෂ්ණ පාර සහ PP-A 739 දරන පිඹුරේ ලොට් අංක 1 ද, නැගෙනහිරට PP-A 739 දරන පිඹුරේ ලොට් අංක 1 සහ මහනගර සභා අගල ද, දකුණට : ලොට් FIDC සහ FIDB දරන කොටස් ද, බටහිරට ፡ පාර ද (ලොට් FIDI) යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් පර්චස් තිස්හතයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 37.30) හෙවත් හෙක්ටයාර් 0.0943 ක් වූ ද ඉහත කී ලොට් අංක 1 දරන බෙද වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ SPE 139/138 දරන හිමිකම් වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් මා හට පවරන ලද බලය යටතේ ඉහත සඳහන් දේපළ **2021 සැප්තැම්බර් මස 02 බ්‍රහස්පතින්ද දින පෙරවරු 11.30** මහජන බැංකුව බටහිර කලාප I ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණනු ලබන බව දැනුම් දෙමු.

කොළඹ වැල්ලවත්ත රාමක්‍රිෂ්ණ පාරේ මීටර් 250ක් පමණ ගිය විට වම් දිශාවෙන් අදාළ දේපළ පිහිටා ඇත.

*විකිණීමේ නිවේදනය සඳහා .-* කරුණාකර වැඩි විස්තර සඳහා 2020 සැප්තැම්බර් මස 04 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* සහ ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් පරිහරණය කරන්න.

*ගෙවීමේ ක්‍රමය. -* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙළීමත් සමගම පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිල මත වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. විකුණුම් පිරිවැය සහ අනෙකුත් සියලුම ගාස්තු තිබේ නම්,
5. විකුණුම් සහතිකය සඳහා වූ මුද්දර ගාස්තු,
6. මිලදී ගත් මිලෙන් ඉතිරිය 90% ක් වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ දකුණ) මහජන බැංකුවේ, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (බටහිර කලාප I) පළමු වන මහළ, කොළඹ 11, ආදිපාද වීදිය, කොළඹ 01 වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත එම මුදල නොගෙවන්නේ නම්, දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහෝසි කර දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුව පවතී.

හිමිකම් ඔප්පුව සහ අනෙකුත් අදාළ ලියකියවිලි පහත ලිපිනයෙන් ලබා ගත හැකි ය.

ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ දකුණ)
මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (බටහිර කළාප I),
පළමු වන මහළ,
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.
දුරකථන අංක : 011-2387068, 011- 2387069.

පෙර දැනුම්දීමකින් තොරව වෙන්දේසිය පැවැත්වීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 11/55, බෝගහවත්ත, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංක : 011- 2053286, 072 - 3207533, 076-9217329.

08-192

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2021 වර්ෂය** | | | | | |
| **අගෝස්තු** | 2021.08.06 | සිකුරාදා | 2021.07.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.08.13 | සිකුරාදා | 2021.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.20 | සිකුරාදා | 2021.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.27 | සිකුරාදා | 2021.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2021.09.03 | සිකුරාදා | 2021.08.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.10 | සිකුරාදා | 2021.08.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.17 | සිකුරාදා | 2021.09.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.24 | සිකුරාදා | 2021.09.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2021.10.01 | සිකුරාදා | 2021.09.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.08 | සිකුරාදා | 2021.09.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.15 | සිකුරාදා | 2021.10.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.22 | සිකුරාදා | 2021.10.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.29 | සිකුරාදා | 2021.10.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.